museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2022 සැප්තැම්බර්

# MMCA ශ්‍රී ලංකා ජෝර්ජ් කීට් පදනම සමග හවුල් වේ.

*ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය ජෝර්ජ් කීට්ගේ තෝරාගත් සිතුවම් ලේඛනගතකර ඒවා පිළිබඳ දැනුවත්බව ඇතිකරමින් මෙම ශ්‍රී ලාංකික කලාකරුවාගේ නිර්මාණ ප්‍රදර්ශනයකරයි.*

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) නූතන හා සමකාලීන කලාව පිළිබඳ වැඩිදුර ඉගෙනීමට මහජනයාට පිටිවහලක්වීමේ අරමුණින්, තම ප්‍රදර්ශන අභිරක්ෂණයකිරීමට බොහෝ ණයදායකයන් සහ පෞද්ගලික එකතුකරන්නන් සමග එක්ව වැඩකරයි. ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරයේ විවිධ කාර්යාලවල ස්ථාපිත ජෝර්ජ් කීට් පදනම් එකතුවට (GKF) 2021දී කෞතුකාගාරයට ප්‍රවේශය ලබාදුණි. ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා සහ අභිරක්ෂක සන්දෙව් හැන්ඩි MMCA ශ්‍රී ලංකාහි දෙවන ප්‍රදර්ශනයවන කීට්ගේ සිතුවම් හතරක් කලා සංදර්ශක හතරක කේන්ද්‍රයේ ස්ථානගතකර ඇති 'මුණගැසීම්' සඳහා පෙළඹුමක් මෙම පර්යේෂණ චාරිකාවේදී සොයාගත්තෝ ය.

මෙම හවුල පිළිබඳව අදහස් දක්වමින් පෙරේයිරා මෙසේ පැවසුවා ය, "සතියේ දින හතේම පහසුවෙන් නැරඹිය හැකි කීට්ගේ කලාකෘති මහජන සංදර්ශනයේ නැති නිසා GKF සභාපති මයික් ඇන්ටෝනියාස්ගෙන් ජෝර්ජ් කීට්ගේ කලාකෘති ගැන මගපෙන්වූ සංචාරයක් ලැබීම සහ ඔහුගේ භෞතික කලාකෘති දැකගැනීමට ලැබීම මහඟු අවස්ථාවක්." මෙම නිරීක්ෂණය 2022 පෙබරවාරි මස මහජනයාට විවෘතවූ, නොමිලේ පැවැත්වෙන "මුණගැසීම්හි" කීට්ගේ කලාකෘති ඇතුළත්කිරීම සලකාබැලීමට පෙරේයිරා සහ හැන්ඩි යොමුකෙරුණු ප්‍රධාන සාධකයක් විය.

"නැගී එන කලාකරුවන්ගේ කලාකෘති සහ ශ්‍රී ලාංකීය කලාව ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්තියෙන් 1988දී GKF ආරම්භ වුණේ මෙම කලාකරුවා ජීවිත්ව සිටියදී. MMCA ශ්‍රී ලංකා වැනි ශ්‍රී ලාංකීය කලාකරුවන්ගේ කලාකෘති ලේඛනගතකරන, දැනුම වඩවන සංවිධානයක් සමග එක්ව වැඩකිරීම අපට උද්දාමය ගෙන දෙන කරුණක්. පසුගිය කාලය පුරා මෙම පදනම විසින් 'කලා පොළ' වාර්ෂික එළිමහන් වෙළඳ ප්‍රදර්ශනය, 'තරුණ සමකාලීනයන්', 'නව කලාකරුවෝ' සහ 'ශ්‍රී ලාංකීය කලා ප්‍රදර්ශන' වැනි මුලපිරීම් රැසක් මෙහෙයවූවා. අපේ අරමුණ කීට්ගේ කලාකෘති සංරක්ෂණයකිරීමවන අතර, ඔහුගේ කලාකෘති පිළිබඳ ප්‍රකාශන රැසක් අප විසින් පළකර තිබෙනවා. මේ

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

අතුරින් කීට්ගේ 2001 ශත සංවත්සර සමරු ප්‍රකාශනය ඉතා විශේෂයි”, ජෝර්ජ් කීට් පදනමේ සභාපති මයික් ඇන්ටෝනියාස් පැවසුවේ ය.

සංදර්ශිත කලාකෘති පිළිබඳ අදහස් දක්වමින් හැන්ඩි කියා සිටියේ, “ජෝර්ජ් කීට් කියන්නේ ලංකාවේ ඉතා ප්‍රසිද්ධ නමක්- නමුත් ප්‍රකාශනයන් හරහා හැර ඒවාට වෙනත් ප්‍රවේශයක් නොමැති නිසා ඔහුගේ සැබෑ කලාකෘති පිළිබඳව මහජනයාට ඇත්තේ ඉතාමත් සීමිත දැනුමක්.. අනෙකුත් නූතන කලාකරුවන් හා සැසඳිය කළ ප්‍රකාශිත දෑ වැඩි වුව ද, සුනිශ්ෂිතව සිතුවම් විශ්ලේෂණයකරන කෘති ඉතා සුලභයි. “මුණගැසීම්” ප්‍රදර්ශනය හරහා අපට අවශ්‍යවන්නේ පෙබරවාරි 11සිට මැයි 22 තෙක් පළමු වටමාරුවේ කොටසක් ලෙස සංදර්ශනයවන කීට්ගේ ‘The Friends’ (1982) හා ‘Pounding Paddy’ (1952) සහ නොවැම්බර් 13 සිට මාර්තු 19 තෙක්තෙවන වටමරුවේ කොටසක් ලෙස සංදර්ශනයවන ‘The Offering (1949) හා ‘Kandyan Bride’ (1951) යන සිතුවම් හතරට ප්‍රේක්ෂකයින් හුරුකිරීමයි.

“මේ සිතුවම් හතර ශාර්මිණීට සහ මට ‘මුණගැසීම්’ ප්‍රදර්ශනයට ආරම්භක ලක්ෂ්‍යයන් ලබාදුන්නා. අනෙකුත් කලාකරුවන්ගේ කලාකෘති සමග සංවාදයක්, එසේත් නැත්නම් ‘මුණගැසීම්’ අපි නිර්මාණය කරා. ඊට ප්‍රදීප් තලවත්ත (b.1979), අබ්දුල් හාලික් අසීස් (b.1985), ඕබ්රි කොලෙට් (1920–1992), මාටින් වික්‍රමසිංහ (1890–1976), අසායි රාසයියා (1946–2021), රිචඩ් ගේබ්‍රියල් (1924–2016), සුසිමන් නිර්මලවාසන් (b.1982), ඒ. මාර්ක් (1933–2000), නෙලුන් හරස්ගම (b.1959), සහ ජනනි කුරේ (b.1974) යන අයගේ නිර්මාණ ඇතුළත් වෙනවා” යැයි සන්දෙව් හැන්ඩි වැඩිදුරටත් පැවසුවේ ය. විවිධ පරම්පරාවල කලාකරුවන්ගේ සමාන විෂය කරුණු ගවේෂණයකරන කලාකෘති සන්නිධානයකිරීම MMCA ශ්‍රී ලංකා විසින් දිරිගන්වා ඇත. මෙම අභිරක්ෂක ප්‍රවේශය අලුත් හා අනපේක්ෂිත ආකාරයෙන් කලා ඓතිහාසික වෘත්තාන්ත දෙස බැලීමට සහ ඒ ගැන සිතීමට දායක වේ.

GKF දැනට මුහුණදෙන ගැටළුවලින් එකක් වන්නේ ඔවුන්ගේ එකතුව රැකබලාගැනීමට වැයවන මුදලයි. කීට් විසින් අඳින ලද සිතුවම් සහ චිත්‍ර සංරක්ෂණයකිරීම ද ඊට ඇතුලත් වේ. ‘මුණගැසීම්හි’ කොටසක් ලෙස කීට්ගේ සිතුවම් හතරක් සාර්ථකව සංරක්ෂණය විය. සංරක්ෂණ කටයුතු පිළිබඳව අදහස් දක්වමින් ConsArtහි උදය හේවාවසම් පැවැසුවේ, “විශාලත ම හානිය සිදුවී තිබුනේ ලී දඬුවලට. ඒවා සම්පූර්ණයෙන්ම කෘමීන්ගෙන් (දැව පණුවන්ගෙන්) ආසාදනයවී තිබූ නිසා කිසිදු භෞතික ස්ථාවරත්වයක් ලබාදුන්නේ නැහැ. එවැනි අවස්ථාවල සියලු දඬු ප්‍රතිස්ථාපනයකිරීම හැර වෙනත් විකල්පයක් නැහැ. ගංවතුරක් නිසා විශාල තීන්ත ප්‍රමාණයක් අහිමිවී තිබුනේ එක් සිතුවමක පමණයි. වාසනාවට, GKF ලබාදුන් හානිය සිදුවීමට පෙර ගත් සිතුවමේ ඡායාරූපය නැතිවූ නිශ්චිත කොටස ප්‍රතිසංස්කරණයකිරීමට උපකාර වුනා.” උදය හේවාවසම් යනු වඩාත් දැනුමැති හා පළපුරුද්දක් ඇතිමෙරට නූතන කලාකෘති සංරක්ෂණයකරන්නන්ගෙන් කෙනෙකි. ඔහුගේ සංරක්ෂණාගාරයවන ConsArt විසින් මාස ගණනාවක් පුරා සිදුකරන ලද තීව්‍ර සංරක්ෂණ කටයුතු නොවන්නට කීට්ගේ කලාකෘති මහජනයා සමග බෙදාගැනීමට නොහැකිවීමට ඉඩතිබුණි.

සංරක්ෂණ ක්‍රියාවලියේ එක් විශේෂ අවස්ථාවක් වූයේ පෙර පැවති ප්‍රදර්ශනවල විස්තර සහ සිතුවම්වල මාතෘකා පිළිබඳ තොරතුරු ඇතුළු සටහන් සිතුවම් පිටුපසින්

අනාවරණයවීමයි. සම්මත සංරක්ෂණ පිළිවෙත් අනුගමනයකරමින් "මෙම ලේබල් ආරක්ෂිතව ගලවාදැමීමෙන් පසුව, ඒවා නිරාම්ලිකරණයකොට, ආරක්ෂිත හා අම්ල-රහිත මුද්‍රා තැබූ විනිවිද පෙනෙන ආවරණයක බහා, සිතුවමේ පිටුපසට ප්‍රතිස්ථාපනයකළේ" යැයි උදය තහවුරුකළේ ය.

MMCA ශ්‍රී ලංකාහි නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයක් නිර්මාණයකිරීමේ අභිලාෂය රඳා පවතින්නේ අභිරක්ෂකයින් විසින් කලාකරුවන්ගේ කලාකෘති ඉදිරිපත්කරීම හැඩගස්වන හා ඊට ගුණයක් ගෙනදෙන කලාකෘති පිළිබඳ තොරතුරු හෙළිකිරීමට උපකාරවන කෞතුකාගාර ක්ෂේත්‍රයේ එවැනි ප්‍රවීණයන් හා වෘත්තිකයන්ගේ කාර්යභාරය මත ය.

'මුණගැසීම්' සඳහා යුරෝපා සංගමය, Foundation for Arts Initiatives, ජෝන් කීල්ස් පදනම සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව නොමසුරුව සහය වේ. ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) යනු සාමාන්‍ය ජනතාව, පාසල්, මෙන් ම සංචාරකයන්ගේ ද ප්‍රයෝජනය හා රසවින්දනය සඳහා නූතන සහ සමකාලීන කලා කෘති ප්‍රදර්ශනය, පර්යේෂණය, රැස්කිරීම සහ සංරක්ෂණය වෙනුවෙන් කැප වූ පොදු කෞතුකාගාරයක් පිහිටුවීම අරමුණු කරගත් අධ්‍යාපනය පෙරටුකරගත් මුලපිරීමකි.